**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මුල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පවරාගෙන තිබූ රු.5,100,000ක් වටිනා ඉඩම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉඩම්වල ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.5,577,006ක් ගිණුම්ගත කර නොතිබුණි. | එම | එම |
| (ඇ) | වටිනාකම රු.134,700 ක් වූ යන්ත්‍ර උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එම | එම |
| (ඈ) | පෙර වර්ෂයට අදාළ රු.40,952ක ඌන විගණන ගාස්තු වෙන් කිරීම අදාළ වියදම් ගිණුමට ගැළපීම් නොකර ණයහිමි ගිණුමට ගැළපීම් කර තිබුණි. | එම | එම |
| (ඉ) | ජීප් රථයක 2644 ප්‍රත්‍යාගණන වටිනාකම රු.2,500,000ක් වූ අතර එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | එම | එම |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි ජල බදු ශේෂය රු.2,593,303ක් වූ අතර උප ලේඛන අනුව රු.2,620,413ක් වූයෙන් රු.27,110ක වෙනසක් විය. | ඉදිරියේ දී මෙම කටයුතු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.332,155ක් වටිනා ගිණුම් ශේෂ 02ක්, උපලේඛන සහ ඊට අදාළ අනෙකුත් සාක්ෂි නොතිබීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | මේ සම්බන්ධ කිසිදු තොරතුරක් සභාව සතුව නොපවතින බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | | අනුකූල නොවීම. | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | | |
| | (i) | අංක 5(3) රීතිය | ආදායම් එක් රැස්කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් පවත්වා නොතිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) | අංක 5(6) රීතිය | නියමිත කාලසීමාව තුළදී ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු සියළු ආදායම් හා වෙනත් ගාස්තු අදාළ නිලධාරීන් විසින් එකතු කර නොතිබුණි. | සියළු අදායම් අයකර ගැනීමට ඉදිරියේදි කටයුතු කරන බව. | - එම - |
| (ආ) | 2013 අංක 01 දරණ ප්‍රජාමූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික | | ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කරවීම හා අධීක්ෂණය එම ප්‍රදේශයේ පළාත් පාලන | ඉදිරියේදී වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය | ආයතනයට පවරා දී තිබුණු නමුත් බල ප්‍රදේශයේ ස්ථාපිත ප්‍රජාමූල සංවිධාන අතරින් 16ක් වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයේ ලියාපදිංචි කරවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඒකකයේ ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,769,980ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,791,535ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ---------------- | ----------- | --------- | -------- | --------- | ---------- | -------- | ------- | ------- |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 9,813 | 12,425 | 9,125 | 3,203 | 8,797 | 8,452 | 5,116 | 3,159 |
| කුලී | 6,024 | 2,019 | 1,929 | 641 | 4,303 | 2,137 | 1,936 | 1,240 |
| බලපත්‍ර ගාස්තු | 204 | 201 | 201 | - | 179 | 73 | 73 | - |
| වෙනත් ආදායම් | 45,718 | 37,216 | 37,216 | - | 34,407 | 36,691 | 36,691 | 1,023 |
| එකතුව | 61,759 | 51,861 | 48,471 | 3,844 | 47,686 | 47,353 | 43,816 | 5,422 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.583,317ක්, ජල බදු රු.2,620,413ක් සහ කුලී රු.641,395ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජල සැපයුම විසන්ධි කර තිබූ පාරිභෝගිකයින් 65 දෙනෙකුගෙන් රු.264,026ක මුදලක් අයවීමට තිබුණි. | අවශ්‍ය ලේඛන නිසි ලෙස නඩත්තු කර නොතිබීම හේතුවෙන් නීතිමය පියවර ගැනීමට නොහැකි වී ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ ශේෂය තුළ දක්වා තිබූ රු.860,201ක කරුවලගස්වැව නව ජල ව්‍යාපෘතියේ අත ඉතිරි ජලනළ උපාංග ශේෂය භෞතිකව ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අත ඉතිරි ජලනළ උපාංග ශේෂය භෞතිකව ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නාත්තණ්ඩිය ඉතිරි කිරීම් බැංකු ශාඛාවේ රු.74,277ක මුදලක් නිශ්ක්‍රීයව පැවතුණි. | ඉදිරි වැඩකටයුතු සිදුකිරීමට කටයුතු කරන බව. | ගිණුම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 24ක් 2015 වර්ෂයේ සිට බලපත්‍ර ලබා නොගැනීමත් ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු නොකිරීමත් හේතුවෙන් සභාවේ වගකීම පැහැරහැර තිබුණි. | ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර ව්‍යාපාර ස්ථාපිත බව තහවුරු කර බලපත්‍ර ලබා දිම සඳහා කටයුතු සිදුකරන බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජල ගබඩා තොග ශේෂයෙන් නිකුත් කිරීම් නියෝග නොමැතිව රු.404,895ක ද්‍රව්‍ය නිකුත් කර ඇතත් එම ද්‍රව්‍ය හඳුනා ගැනීම අපහසු වී තිබුණි. | ඉදිරියේදී නිකුත් කිරීමේ නියෝග මගින් ගබඩා භාණ්ඩ නිකුත් කිරීමට කටයුතු කරන බව. | නිකුත් කිරීමේ නියෝග මගින් ගබඩා භාණ්ඩ නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02ක වටිනාකම වූ රු.10,011,592ක් වූ අතර ඒ තුල වර්ෂ 03ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.160,458ක් විය. | හිග මුදල් අයකර ගැනිමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02ක වටිනාකම වූ රු.11,081,129 ක් වූ අතර ඉන් වර්ෂ 03කට වැඩි රු.101,363ක ශේෂයක් විය. | සිහි කැඳවීමක් කර නැවත ලිපි යොමුකර අදාළ රැඳවුම් මුදල නිදහස්කිරීමට කටයුතු කරන බව. | ණය හිමියන් කඩිනමින් පියවීමට කටයුතු කල යුතුය |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 05කට වරක් තක්සේරු කරන ලද වරිපනම් බදු ප්‍රතිශෝධනයක් කල යුතු වුවත් සභා බල ප්‍රදේශය තුල 2015 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව මත ම 2023 වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි. | වරිපනම් බදු තක්සේරුවක් සඳහා කටයුතු කරන බව. | වරිපනම් බදු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පුරනැගුම ව්‍යාපෘතිය අවසානයේ වටිනාකමක් සඳහන් නොකළ ඉතිරි වූ ජලනළ උපාංග විශාල ප්‍රමාණයක් සභාවට භාරදී තිබූ අතර එම ජලනළ උපාංග වටිනාකම ගණනය කර ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කරන බව. | ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකර සභාවට පවරන ලද මැදගම ළමා උද්‍යානය වසර 16කට වැඩි කාලයක සිට භාවිතා නොකිරීම හේතුවෙන් අධික ලෙස කැළෑවෙන් වැසී තිබීම නිසා එහි ඇති ක්‍රීඩා උපකරණවලට ස්වාභාවික උපද්‍රවවලින් හානි සිදුවීමේ අවධානමක පැවතුණි. | ළමා උද්‍යානය පෙර පාසලට පැවරීම සඳහා අදාළ කටයුතු සිදු කරන බව. | නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කළ යුතුය. |
| (ආ) | සභාව සතුව රු.21,262,185ක් වටිනාකමැති වත්කම් 04ක් නිශ්ක්‍රීයව පැවතුණි. | අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සහා ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් හා සභාව විසින් භුක්ති විඳින, පාලනය හා නඩත්තු කෙරෙන ක්‍රීඩාපිටි, ප්‍රජා ශාලා පිහිටි භූමි හා සුසාන භූමි 65ක නිත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉදිරියේදී පවරා ගැනීම සඳහා කටයුතු කරන බව. | නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් රු.16,728,062 ක ව්‍යාපෘති 08ක් කරුවලගස්වැව විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදී තිබූ අතර ඒ සියල්ලම සමූපකාර සමිතිය විසින් උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | අදාල ආයතනයට උපකොන්ත්‍රාත් ලබා දීමට අවශ්‍ය බලයක් අප ආයතනය මගින් ලබා දී නොමැති බව. | බලයක් නොමැතිව උප කොන්ත්‍රාත් දීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබූ රු.1,000,000ක ප්‍රතිපාදන වැයකර අලාභ හානිව ඇති මාර්ගවල බෝක්කු සකස් කිරීමේදී ස්ථාන හඳුනා ගැනීමකින් තොරව රු.994,000ක වැයකර හියුම් පයිප්ප මිලදී ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තෘතියික තනතුරු 01ක්ද ද්විතියික තනතුරු 08ක්ද ප්‍රාථමික තනතුරු 09ක්ද පුරප්පාඩු වී තිබුණි. | පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගැනිමට ඉදිරියේදී කටයුතු කරන බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනා ගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.8 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ මෝටර් ග්‍රේඩරයට අදාළව 2022 අගෝස්තු 30 සිට 2023 ඔක්තෝබර් 08 දක්වා වූ අවුරුදු 01 මාස 01ක කාලයක් සඳහා ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබූ අතර මයිලෝ මීටරය අනුව එම කාලය තුළ මීටර් පැය 86ක් ධාවනය කර තිබුණි. | මෙම කාලසීමාව තුළ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ධාවන තත්වයේ නොතිබුණි. | ධාවනයට අදාළ සටහන් නිවැරදිව ලිවිය යුතුය. |
| (ආ) | සභාවේ මෝටර් ග්‍රේඩරයේ ධාවන සටහන්වල ඉන්ධන ඇතුළත් කිරීමේදී කිසිඳු සටහනක් නැති ලීටර් 890ක්ද සම්පත් ලෙස සටහන් කළ ලීටර් 325ක්ද ඉන්ධන ඇණවුම් අංක සහිත ලීටර් 478ක්ද වීමෙන් අධීක්ෂණයකින් තොරව ඉන්ධන ඇතුළත් කර ධාවන සටහන් පිළියෙල කර තිබුණි | රියදුරු මහතා විදේශගතව ඇති නිසා විමසීමක් සිදුකිරීමට නොහැකි බව. | ධාවන සටහන් වල නිවැරදිව සටහන් තැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ ජල බවුසරයේ දෛනික ධාවන සටහන් තුලනය කිරීම කර නොතිබූ අතර මයිලෝ මීටරයෙහි දැක්වෙන සැතපුම් ගණනද සඳහන් කර නොතිබුණි. | මේ වන විටත් LP-3256 බවුසර් රථයේ ඉන්ධන පරික්ෂාවට අදාල ඉල්ලීමක් යාන්ත්‍රික ඉංජිනේරු මහතා වෙත යොමුකර ඇති බවත් හා ධාවන සටහන් ලිවීමේදී මයිලෝ මීටරයේ සඳහන් මීටරය සටහන් කරන ලෙස රියදුරු මහතාට උපදෙස් ලබා දුන් බව. | නිවැරදිව ඉන්ධන තුලනය කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂිරීක ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 05ක් ඉටු කිරීම සඳහා රු.6,182,625ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | වැයකරන ලද මුදල් ප්‍රමාණයට අපේක්ෂිත නිමවුම ලබා ගැනීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 4.2 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව සභාව විසින් 2020 වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු 08ක් හඳුනාගෙන තිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 12 ක සිට 100 ක් දක්වා විය. | ඉදිරියේ දී නිවැරදිව කටයුතු කිරීමට වග බලා ගන්නා බව. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අදාළ අරමුණු හා ඉලක්ක ලහා කර ගැනීමට කටයුතු කළ යුතුය. |